රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2014 (IV)

මගේ අංකය : EST-2/05/POL/0059
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2017.05.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 02 ඡේදයේ I උපඡේදයට සහ 03 ඡේදයේ IV උපඡේදයට පහත සඳහන් විධිවිධාන ඇතුළත් කරමින් සංශෝධනය කිරීමට 2017.01.31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව 02 ඡේදයේ I උපඡේදයට පහත සඳහන් විධිවිධාන ද ඇතුළත් කරනු ලැබේ.

> "2007.07.01 දිනට පෙර රාජ්‍ය සේවයට ඇතුළත්ව සීමිත හෝ කුසලතා පදනම මත උසස්වීම් ලබා 2017.01.31 දිනට වයස අවුරුදු 50 සම්පූර්ණ කර ඇති හෝ 2007.07.01 දිනට පෙර රාජ්‍ය සේවයට ඇතුළත්ව සීමිත හෝ කුසලතා පදනම මත උසස්වීම් ලබා ගන්නා අවස්ථාවේ දී වයස අවුරුදු 50 සම්පූර්ණ කර ඇති හෝ නිලධරයන් තමන් නව පත්වීම් ලැබූ ඉහළ තනතුරට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ මග පෙන්වීම මත සකස් කරනු ලැබූ විෂය නිර්දේශ අනුව පවත්වනු ලබන පැය 100ක භාෂා පුහුණු පාඨමාලාවක් සඳහා සහභාගීත්වය පමණක් ප්‍රමාණවත් වේ."

04. එසේම 03 ඡේදයේ IV උපඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

> "ප්‍රාථමික ශ්‍රේණියේ සියලු නිලධරයන් සඳහා අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම වන 4වන කාණ්ඩය සමත් වීම අවශ්‍ය නොවන අතර ඒ සඳහා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ මග පෙන්වීම මත සකස් කරනු ලැබූ විෂය නිර්දේශය අනුව පවත්වනු ලබන පැය 50ක භාෂා කුසලතා වර්ධනය සඳහා වන පාඨමාලාවක් සඳහා සහභාගීත්වය පමණක් ප්‍රමාණවත් වේ."

05. ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයෙන් ලබාදෙන විෂය නිර්දේශ මත මෙම පාඨමාලා ආයතන ප්‍රධානීන් විසින් ආයතන මට්ටමින් සංවිධානය කළ යුතු අතර පුහුණු පාඨමාලාවන් සඳහා නිලධරයන් සහභාගී කරවීම, සහභාගීත්ව සහතික ලබාදීම අදාළ ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් වේ. ප්‍රාථමික ශ්‍රේණියේ නිලධරයන් සඳහා මෙම පාඨමාලා සඳහා සහභාගීත්ව සහතිකය නිලධරයාගේ ඊළඟ ශ්‍රේණියට උසස් වීමේ දී සුදුසුකමක් ලෙස සැළකිය යුතු අතර ඒ අනුව අදාළ සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය කරගත යුතුය.

06. මෙම චක්‍රලේඛය මඟින් සංශෝධිත විධිවිධාන හැර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට සංශෝධන ලෙස නිකුත් කරන ලද සියලුම චක්‍රලේඛවල සඳහන් අනෙකුත් කොන්දේසි හා විධිවිධාන තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

07. මෙම විධිවිධාන 2017.01.31 දින සිට බලාත්මක වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය